# පුරප්පාඩු

## ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාල, ශ්‍රී පාලි මණ්ඩපය සඳහා වැඩ පැවරුම් පදනම මත පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් 2021.07.21 වැනි දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.**

## තාක්ෂණික නිලධාරී (තොරතුරු තාක්ෂණ)

**සුදුසුකම් :**

(i) අ.පො.ස. (උසස් පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම.

**සහ**

(ii) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ / තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ National Vocational Qualification 5 වෙනි මට්ටමට නොඅඩු නිපුණතා සහතික පත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

**සටහන** : ජාල කළමනාකරණයට අදාළ රැකියා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය** : U - MT1

රු. 31,625/- (මාසික) හා විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**පොදු කරුණු** :

➢ **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුයි.

➢ **තෝරා ගැනීම** : ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

**සේවා කොන්දේසි** : මෙම පත්වීම වැඩ පැවරුම් පදනම මත වසරක කොන්ත්‍රාත් කාලයකට සීමා වේ.

**අයදුම්පත් එවිය යුතු ආකාරය :**

- අයදුම්කරුවන් ජීව දත්ත තොරතුරු ඇතුළත් වන සේ තමන් විසින් පිළියෙළ කරගත් අයදුම්පතක් අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික පිටපත් ද සමග නියෝජ්‍ය ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ යන ලිපිනයට 2021.07.21 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.
- අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.
- අසම්පූර්ණ, අපැහැදිලි, සහතික වල පිටපත් අමුණා නොමැති හෝ ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය,**
**වැවල, හොරණ.**
**2021.07.14**